**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) III අදියර - 2013**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) III අදියර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා රජය විසින් සපයනු ලබන අරමුදල් යොදාගනිමින් පිටත වටරවුම් මහාමාර්ගයේ කඩවත සිට කෙළවරපිටිය දක්වා කිලෝමීටර් 9.32 ක මාර්ග කොටස් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් සිදුකරන කාර්යයන් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් චීන එක්සිම් බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින ණය ගිවිසුමක් අත්සන් කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

---

ලැබුණු තොරතුරු වලට අනුව, එවකට මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

ව්‍යාපෘතියේ අරමුණු වන්නේ ,

(අ) කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරිමට හා රටේ අනෙකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වෙමින් ප්‍රධාන මාර්ග වලට සහ දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධ කෙරෙන කොළඹ අවට ප්‍රදේශ යාකෙරෙන මහාමාර්ගයක් ඉදිකිරීම මඟින් කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අවම කිරීම හා අවට ප්‍රදේශ සමඟ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමයි.

2013 ජනවාරි 21 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, රු බිලියන 66.7 ක පිරිවැයකට මාස 42 ක් ඇතුළත මාර්ග කොටසේ ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් චීන මහජන සමූහාණ්ඩුවේ කොන්ත්‍රාත්කරුවකු සමඟ 2013 පෙබරවාරි 22 දින කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම**

---------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂාකිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබූවේ ද යන බව.

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව හා

(ඈ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

**3.** **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ

ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 1,205,886,641 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** |
|---|---|
| | රු. |
| ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීම | 1,189,616,518 |
| ව්‍යාපෘති කළමනාකරනය | 12,054,796 |
| පර්යේෂණ හා සංවර්ධනය | 4,215,327 |
| | 1,205,886,641 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1. ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පොලී හා වන්දි ගෙවීම සඳහා නිකුත් කරන ලද රු.10,701,484 ක් වූ චෙක්පත් අවලංගු කිරීම වාර්තා කිරීම සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

(අ) විවිධ කාර්යයන් සඳහා ගෙවන ලද රු.4,397,508 ක් වූ අත්තිකාරම් ආධාරක ලියකියවිලි නොමැතිව නැවත පදිංචි කිරීම හා වැඩබිම් සංවර්ධන වියදම් ගිණුම් වලට මාරුකර තිබුණි.

(ආ) වන්දි ගෙවීම මත එකතුව රු.285,265,900 ක් වූ ගෙවූ පොලී පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

--------------------------------------

6.1 අරමුදල් උපයෝජනය

-------------------------

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු රු.මිලියන 1,206 ක් වූ දායකය යොදාගනිමින් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති කාර්යයන් සිදුකර තිබුණි. මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ 2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවල රු.මිලියන 2,073 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

6.2 මාර්ග ඉදිකිරීම පිළිබඳ භෞතික ප්‍රගතිය

-------------------------------------------

කොන්ත්‍රාත්කරු හා මාර්ග සංවර්ධන අධිකාරිය අතර 2013 පෙබරවාරි 22 දින කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් වැඩ ආරම්භ කර නොතිබුණි.

6.3 ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ කටයුතු

-------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගන්නා ලද කඩවත පිහිටි හෙක්ටයාර් 2.48 ක් වූ ඉඩමේ මායිම් වෙන්කිරීම සඳහා 2013 දෙසැම්බර් 31 වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේ ප්‍රමාදය මත 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.298,605,978 ක් වූ පොලී, ව්‍යාපෘතිය විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2007 පෙබරවාරි මාසයේදී පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය - අදියර II විසින් අත්පත් කරගෙන මෙම ව්‍යාපෘතියට මාරුකරන ලද වත්තල හීන්කෙන්ද මිල්ලගහවත්ත පිහිටි හෙක්ටයාර් 2.6348 ක ඉඩම අවතැන් වූ පුද්ගලයන් අතර බෙදාහැරීමට පියවර ගැනීමෙන් තොරව එදින සිට නිෂ්කාර්යව පැවතුණි. තවද සම්පූර්ණ ඉඩම කොටස් 57 කට මායිම් වෙන් කර තිබූ අතර ඉඩම් කැබලි 26 ක් පමණක් අවතැන් වූ පුද්ගලයන් විසින් ඉල්ලුම් කර තිබුණි.

(ඈ) කඩවත ජයසුමන වත්ත නමැති තවත් ඉඩමක් 2011 වර්ෂයේදී පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතියේ - අදියර II විසින් අත්පත් කර ගෙන තිබූ අතර එය වටා වැටක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය විසින් රු.377,077 ක් ද වැය කර තිබුණි. කෙසේ වුවද එම ඉඩමේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඉ) අධිවේගී මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගන්නා ලද ඉඩමක වටිනාකම හානිපූර්ණය කිරීම සඳහා මත්තුමගල කරුණාරත්න බෞද්ධ මහා විද්‍යාලයට අයත් ගොඩනැඟිල්ලක් ප්‍රතිසංස්කරණය කිරීමට ව්‍යාපෘතිය විසින් රු.53,453,560 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද ඉඩමේ ඔප්පුව, අනුමත ගොඩනැඟිලි සැලැස්ම සහ අදාළ ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ව්‍යාපෘතිය විසින් අත්පත් කරගන්නා ලද ඉඩමේ පැවති ගොඩනැඟිල්ල ව්‍යාපෘතියෙන් වන්දි ලැබීමෙන් පසු මාස 6 ක කාලයක් ඇතුළත කඩාදමා හිස් ඉඩම ව්‍යාපෘතියට භාරදීමට අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එකඟ වී තිබුණද වන්දි ගෙවීමෙන් පසු මාස 9 ක් ඉකුත් වී තිබියදීත් ගොඩනැඟිල්ල කඩාදමා නොතිබූ අතර ඉඩම ව්‍යාපෘතියට භාරදීමෙන් තොරව පැවතුණි. තවද, මහල් 4 ක ගොඩනැඟිල්ලක් ඉදිකිරීම සඳහා ගොඩනැඟිලි සැලසුම් පසුව පදනම් රහිතව මහල් 3 කට වෙනස් කර තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි

විධිවිධානවලට පටහැනිව බස්නාහිර පළාතේ අධ්‍යාපන දෙපාර්තුමේන්තුව විසින් නම්කරන ලද කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුගෙන් සීමිත මිල ගණන් කැඳවා තිබුණි.

6.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ සේවක සංඛ්‍යාව 2013 අප්‍රේල් 05 දින සිට බලපැවැත්වෙන පරිදි 2014 අප්‍රේල් 02 දින අනුමත කර තිබුණි. කෙසේ වුවද, **අදියර** III සඳහා ව්‍යාපෘති නියාමන ඒකකයේ මෙහෙයුම්, 2005 අප්‍රේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2(1) වගන්තියෙහි දක්වා ඇති බඳවා ගැනීම් පරිපාටියට පටහැනිව මාර්ග සංවර්ධන අධිකාරියෙන් මුදාහරින ලද සේවක සාමාජිකයන් 26 දෙනෙකුගෙන් 2013 නොවැම්බර් 5 දින සිට ආරම්භ කර තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 07 දිනැති අංක ඩීඑම්එස් 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව නැවත පදිංචි කිරීමේ දීමනාවට හිමිකම් නොමැති නැවත පදිංචි කිරීමේ සහකාරවරයකුට රු.80,985 ක් වූ දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දේශීය උපදේශකවරුන් සඳහා සේවක සංඛ්‍යාව අනුමත කර නොතිබුණද, ව්‍යාපෘතිය විසින් දේශීය උපදේශකවරුන් 09 ක් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.200,000 ක මුදලක් ඔවුන්ට ගෙවා තිබුණි.